## 2023/01/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2023/01/10 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2022.12.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. මේ වර්ෂයේ අවසාන සභාවාරය ඒ වගේම අද විශේෂයි. මොකද 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කරනු ලබනවා. ඒ අනුව අද දින මහා සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2022.12.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

**2022.12.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ, පෙත්සම්, පැමිණිලි ,ලිපි ඉදිරිපත් කිරීම**

01. විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය උඩුගම පඤ්ඤාසාරහිමි උඩුගම දකුණ ගාල්ල.වෙතින් 2023.01.09 දිනැතිව යොමුකරන ලද ශ්‍රී බුද්ධාභි වන්දනා වෙසක් කලාපය(2023) 2023 අප්‍රේල් මස 23 දින සිට මැයි මස 15 දින දක්වා උඩුගම දකුණ මහජන ක්‍රීඩාංගනය වෙන්කරවා ගැනීම සඳහා ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. 2023 වර්ෂය සඳහා පහත සදහන් කමිටු පත් කිරීමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කරන ලදී.

I.මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
II.කාර්මිකසේවා කමිටුව
III.නිවාස හා ප්‍රජාසංවර්ධන කමිටුව
IV.පරිසරකමිටුව
V.ටෙන්ඩර් කමිටුව
VI.තාක්ෂණ ඇගයුම් කමිටුව
VII.පුස්තකාල කමිටුව
VIII.කාරකසභා පත්කිරීම

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලේ ලැබීම් හා වියදම් සම්බන්ධයෙන් හා සභාවට අවශය උපදෙස් ලබාදීම සඳහාත් ඊට අදාළ කාර්ය කටයුතු පිළිබඳව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාවට සළකා බැලීම සඳහා යොමු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගෙන් සමන්විත සංයුතිය 05 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**I. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා,
ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය
තරංග සුදර්ශන මන්ත්‍රීතුමා
අජිත් එඩේිරආරච්චි මන්ත්‍රීතුමා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 ක් වන කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**II. කාර්මික සේවා කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා
ගරු මන්ත්‍රිනී ඉනෝකා විජේවර්ධන මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහාත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයෙන් සමන්විත සංයුතිය 06 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**III. නිවස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, පරිසර විෂයෙහිලා බලපත්‍ර ලබාදීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් පරිසර ගැටළු සම්බන්ධව උපදෙස් ලබා දීම හා නිර්දේශ ලබා දීම සඳහාත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් සහා නිලධාරීන්ගෙන් සමන්විත කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි.

**IV. පරිසර කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා
ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහතා
ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා
මහජන සෞඛ්‍ය පරීක්ෂක (කොට්ඨාශයට අදාළ)
මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරී
අවශ්‍යතාවය මත බාහිර ආයතනික නිලධාරීන්

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්ල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත්, සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**V. ටෙන්ඩර් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත්, මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහාත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත්ල අවශ්‍යතාවය මත තාක්ෂණ දැණුම ඇති බාහිර ආයතනික පුද්ගලයින්ගෙන්ද සමන්විත කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VI.තාක්ෂණ ඇගයුම් කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා
ගරු මන්ත්‍රී ගයාන් මධුෂංක මහතා
ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා
ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය
ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහාත් මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් අවසන් තීරණ සබාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත් සංයුතිය 05 කින් යුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමටත් පාඨක සමාජ සාමාජිකයන් ඇතුළුව කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

**VII. පුස්තකාල උපදේශන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මහත්මිය
ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රිනී කේ. ඒ. චන්දිමා දිල්රුක්ෂි මහත්මිය
ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යයන් හා කර්තවය කිසිවකට හෝ සභාවෙහි සැළකිල්ලට භාජනය වී පවතින යම් කරුණකට හෝ අදාළව උපදෙස් දීමේ කාර්යය සඳහා මහා සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහාත් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අවසන් තීරණ සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමටත් සංයුතිය 06 කින් යුත් පහත නම් සඳහන් මන්ත්‍රී මණ්ඩලයක් පත් කිරීමට යෝජනා කරමි.

**VIII . ප්‍රසම්පාදන කමිටුව**

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා, - කමිටු සභාපති
ගරු උප සභාපති ගාමිණී සුසන්ත මන්ත්‍රීතුමා
ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා
ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා
ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා
ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම සතිපොළ 2022.12.01 වන දින දිනමිණ පුවත්පත් දැන්වීම මගින් ප්‍රසිද්ධ කොට රු. ලක්ෂ 06 (600,000.00) ක අවම ලන්සුවක් යටතේ ටෙන්ඩර් කිරීම සිදු කරන ලදී. නමුත් මේ සඳහා කිසිඳු අයදුම්කරුවකු ඉදිරිපත් නොවුණ හෙයින්, මාගේ උපදෙස් පරිදි නැවත ටෙන්ඩර් මණ්ඩලය 2022.12.29 දින කැඳවා මේ පිළිබඳව කඩිනමින් ඉදිරි කටයුතු සඳහා යොමු වුණි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය වූයේ සභාව මගින් පොළ බදු මුදල් රැස් කලද, අවම ලංසුවෙහි අඩු කිරීමක් අවශ්‍ය නොවන බවත්ය. ඒ අනුව නැවත ටෙන්ඩර් කාලය දීර්ඝ කරන ලෙසය. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් ප්‍රසිද්ධ කොට නැවත හැකි ඉක්මණින් උඩුගම සති පොළ ටෙන්ඩර් කිරීම සුදුසු බවයි. ඒ අනුව 2023.01.04 දින දක්වා නැවත අයදුම්පත්‍ර ලබාදීමේ කාලය දීර්ඝ කොට 2023.01.05 දින ටෙන්ඩරය විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල බව ගරු සභාව දැනුවත් කරමි. 2023.01.05 දින සිදු කල ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් රු. 620,000.00 ක මුදලකට මොරගල්මුල්ල උඩුගම පදිංචි කේ.එච්.එම්. ඉනෝකා දමයන්ති මියට 2023 වර්ෂයට උඩුගම සති පොළ හා දේපලෙහි බදුකාරත්වය පවරන බවද, මේ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

03.තල්ගස්වල බදාදා සතිපොළ 2022.12.01 වන දින දිනමිණ පුවත්පත් දැන්වීම මගින් ප්‍රසිද්ධ කොට රු. ලක්ෂ 12 (1,200,000.00) ක අවම ලන්සුවක් යටතේ ටෙන්ඩර් කිරීම සිදු කරන ලදී. නමුත් මේ සඳහා කිසිඳු අයදුම්කරුවකු ඉදිරිපත් නොවුණ හෙයින්,නැවත ටෙන්ඩර් මණ්ඩලය කැඳවා 2022.12.29 දින මේ පිළිබඳව කඩිනමින් ඉදිරි කටයුතු සඳහා යොමු වුණි. ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය වූයේ අවම ලංසුව ඉහළ අගයක් ගත් බැවින් කිසිඳු අයදුම්කරුවකු ඉදිරිපත් නොවුනු නිසා නැවත ලංසුව රු. ලක්ෂ 9 (900,000.00) දක්වා අඩු කොට නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවයි. ඒ අනුව කමිටු තීරණය සම්බන්ධ යෝජනාව සභා අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා අදහස් දක්වමින්**
ගරු සභාව විසින් තල්ගස්වල සතිපොළ රු.1200000 (ලක්ෂ දොළහ) ක් ලෙස අවම ලන්සු තීරණය විය. නමුත් රු.1200000 (ලක්ෂ දොළහ) ක ට අවම ලන්සුවටවත් ගැනීමට කිසිඳු ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් නොවුන හෙයින් ටෙන්ඩර් කමිටුවේ තීරණය වූයේ අවම වශයෙන් තල්ගස්වල සතිපොළෙන් සභාව විසින් වර්ෂයකදී එකතු කළ මුදල රු.900000 (ලක්ෂ නමය) වත් අවම ලන්සුව වශයෙන් තබාගතයුතු බවයි. නමුත් ටෙන්ඩර් කමිටුව මගින් මහසභා තීරණය වෙනස් කළ නොහැකි බැවින් එය නැවත මහ සභා තීරණයකින් රු.900000 (ලක්ෂ නමය) අවම ලන්සුව තීරණය කළ යුතු බවයි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**
ඉහත කරුණු හේතු කොටගෙන ටෙන්ඩර් කමිටුව තීරණය කරල තියෙනව තල්ගස්වල සතිපොළ අවම ලන්සුව වශයෙන් රු. 900000 (ලක්ෂ නමය) ක් ලෙස ඒ සම්බන්ධව මම ගරු සභිකයන්ගෙන් ඉල්ලා සිටිනව විරෝධතා තිබේ නම් ඉදිරිපත් කරන්න කියල

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා අදහස් දක්වමින්**
රු. 900000 (ලක්ෂ නමය) කට පුළුවන් සභාපති තුමනි මොකද අපි දන්නවනෙ සාමාන්‍යයෙන් තල්ගස්වල සතිපොළෙන් එකතුවෙන ගාන ඒ නිසා ඒ ගාන සුසුසුයි කියල මම කියනව.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

04.සභාව සතු SPGQ 8970 අංක දරණ බැකෝ යන්ත්‍රය රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛ 02/2015 හි 06 (අ )සහ (ආ)අනුව විවෘත මිල ගනන් කැඳවීම හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීම සඳහා පළාත් පාලන කොමසාරිස් තුමා විසින් අනුමැතිය ලබාදී ඇත.ඒ අනුව විවෘත මිලගනන් කැඳවීම ක්‍රමවේදය මගින් බැකෝයන්ත්‍රය වෙන්දේසි කිරීමටත් ඒ සඳහා පුවත්පත් දැන්වීමක් පලකිරීම සුදුසුයැයි ගරුසභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් ප්‍රකාශකරමින්**

වෙන්දේසිය සිදුකරනවනම් බැකෝ යන්ත්‍රය සුළු මුදලකට දීල වැඩක් නැහැ.ඊලග කාරනාව නම් බැකෝ යන්ත්‍රයේ තිබෙන හොද යකඩ ඒ නිසා වෙළදපොලේ පවතින හොද මිලගනනක් යටතේ දෙනව නම් දෙන්න ඕන.

**සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

05. 2023 වර්ෂය සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවට ලැබෙන අනතුරුදායක ගස්කපා ඉවත්කිරීම සඳහා අවශ්‍යවන ගස් කපා ඉවත් කරන්නන් සඳහා විවෘත මිලගනන් කැඳවීමටත්, තවද සභාව විසින් කපා ඉවත් කරන ලද ගස් සඳහා අදාල පාර්ශවයන් ගෙන් නැවත ප්‍රතිපූර්ණය කරන තෙක් අත්තිකාරම් මුදල් ලබා ගැනීමට සුදුසු බවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**06. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**2022.01.10 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 දෙසැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 81,000.00

II. නාගොඩ ප්‍රාදේශීය සභාවේ රියදුරන් හා කාර්යාල කාර්ය සහායකයන් සඳහා නිල ඇඳුම් හා මැහුම් කුලී දීමනා ගෙවීම (රියදුරු 3, කාර්යාල කාර්ය සහායක 3) 4000x6 - රු. 24,000.00

III. සංග්‍රහ වියදම් මුදල් අත්තිකාරම් පියවීම - රු. 4,000.00

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව - රු. 9,164.66**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දෙසැම්බර් මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

2010 වර්ෂය සඳහා හිඟ විගණන ගාස්තු ගෙවීම **- රු.10,000.00**

**04. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල - රු. 6,000.00**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2023 ජනවාරි මස බදු කුලිය ගෙවීම

**05. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

I. 2022.11.10 දින එස් පී 164 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු -. -රු. 5,000.00
II. 2022.12.13 දින එල් 13814 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු -රු. 3,500.00
III. 2022.12.14 දින පී 15977 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු - රු. 3,500.00
IV. පී 15977 නඩුවට අදාළව වාර්තා ලබා ගැනීමේ ගාස්තු - රු. 1,000.00
V. 2023.01.02 පී 14658 නඩුවට අදාළව නීතිඥ ගාස්තු - රු. 8,500.00

**06. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල, ගා/ වදුරඹ**

2022.12.13 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම **-රු. 14,625.00**

**07. විලා මොනරපිල , ධ්‍රම්කින් ස්ටේට්, යටලමත්ත**

2022.12.13 දින පැවති මහ සභා වාරය සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් දිවා භෝජනය සැපයීම වෙනුවෙන් බිල්පත -රු. 23632.00

**08. ජේ.පී. කොමියුනිකේෂන්, නාගොඩ.**

2022 දෙසැම්බර් මස සභා වාර්තා පිටපත් 27ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම **- රු.1,944.00**

**09. ඒ.කේ.නිලන්ති සජීවනී මිය, ග්‍රාෆ්ටෙල් කම්යුනිකේෂන්, යටලමත්ත**

2022 දෙසැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත **-රු.28,500.00**

**10.** ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල්සී, කොළඹ

MP 25015/2001 මුද්‍රණ යන්ත්‍රයට අවශ්‍ය ටෝනර් වර්ග 2 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 43,010.00

**11. The Associated Newspapers of Ceylon Ltd, Colombo 10**

පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කිරීම සඳහා ගාස්තු ගෙවීම (2023 වර්ෂයට ප්‍රසම්පාදන දැන්වීමසතිපොළවල් ටෙන්ඩර් කිරීම, 2023 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ දැන්වීම - රු. 39588.75

**12.** ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම 2022 නොවැම්බර් - රු. 408,820.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.11.02 | PF 7360 කැබ්රථය | 370381 | ඩීසල් | 23 | 9,545.00 |
| 2022.11.04 | | 370383 | | 63 | 26,145.00 |
| 2022.11.07 | | 370384 | | 30 | 12,450.00 |
| 2022.11.09 | | 370386 | | 58 | 24,070.00 |
| 2022.11.12 | | 370388 | | 50 | 21,500.00 |
| 2022.11.15 | | 370390 | | 70 | 30,100.00 |
| 2022.11.17 | | 370391 | | 53 | 22,790.00 |
| 2022.11.21 | | 370394 | | 61 | 26,230.00 |
| 2022.11.24 | | 370397 | | 50 | 21,500.00 |
| 2022.11.28 | | 370399 | | 68 | 29,240.00 |
| | | | එකතුව | **526** | **223,570.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.11.03 | LL 7650 කෘ කැබ් රථය | 370382 | ඩීසල් | 30 | 12,450.00 |
| 2022.11.13 | | 370389 | | 40 | 17,200.00 |
| 2022.11.28 | | 370397 | | 60 | 25,800.00 |
| | | | **එකතුව** | **130** | **55,450.00** |
| 2022.11.12 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 370387 | ඩීසල් | 50 | 21,500.00 |
| | | | **එකතුව** | **50** | **21,500.00** |
| 2022.11.01 | SPRA 8570 ට්‍රැක්ටරය | 370379 | ඩීසල් | 40 | 16,600.00 |
| 2022.11.08 | | 370385 | | 30 | 12,450.00 |
| 2022.11.17 | | 370392 | | 45 | 19,350.00 |
| 2022.11.28 | | 370398 | | 40 | 17,200.00 |
| | | | **එකතුව** | **155** | **65,600.00** |
| 2022.11.17 | **LL 7103** ටිපර් රථය | 370393 | හයිඩ්‍රොලික් ඔයිල් | 05 | 8,500.00 |
| | | | | **05** | **8,500.00** |
| 2022.11.21 | | 370395 | ඩීසල් | 50 | 21,500.00 |
| | | | **එකතුව** | **50** | **21,500.00** |
| 2022.11.01 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370378 | පෙට්‍රල් | 25 | 9,250.00 |
| 2022.11.01 | සභා වාර්තා බෙදා දීම සඳහා | 370378 | 2 T Oil | 01 | 1,600.00 |
| 2022.11.01 | සභා වාර්තා බෙදා දීම සඳහා | 370380 | පෙට්‍රල් | 50 | 1850.00 |
| | | | **මුළු එකතුව** | | **408,820.00** |

**<u>2022.11.12 සිට 2022.11.30 දක්වා සංශෝධිත මිළ ක්‍රියාත්මක වේ</u>**

**13. කළමනාකරු, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, ගාල්ල**

මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය බෙහෙත් වර්ග මිළදී ගැනීම සඳහා බිල්පත - රු. 69,000.00

**14. ඩී.ආර්. ශ්‍යාමන් සෝමසිරි මයා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ගාල්ල**

I. 252-6478 අංක දරන කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා ලබාගත් මිළ ගණන් පරීක්ෂාකර බලා නිර්දේශ ලබාදීම වෙනුවෙන් ගෙවීම - රු. 500.00

II. 252-6478 අංක දරන කැබ් රථයේ අළුත්වැඩියාව සම්බන්ධව පසු වාර්තාව ලබා දීම වෙනුවෙන් ගෙවීම - රු. 500.00

**15. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

SPPF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත රු.38470.00

**16. තල්ගස්වල ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්, තල්ගස්වල**

SPPF 7360 කැබ් රථයේ පිනියන් බැරල් එක අලුතින් දැමීම සහ ස්ටාට් මෝටරය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 9000.00

**17.** ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, මාපලගම

SPPF 7360 කැබ් රථයේ හෙඩ්ලයිට් බල්බ් දෙක අලුතින් දැමීමේ බිල්පත යෙදීම -රු.2060.00

**18. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

ප්‍රාදේශීය සභා මළ අපවාහන පද්ධතිය නැවත සකස් කිරීම වෙනුවෙන් බිල්පත පියවීම රු.30445.00

**19. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම 2022 දෙසැම්බර් **- රු. 14,500.00**

**20. <u>2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)</u>**

| | | | |
|---|---|---|---|
| I. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | **- රු. 6,200.00** |
| II. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | **-රු. 4,000.00** |

**21. 2023 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | | |
|---|---|---|---|
| I. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු.1740.00 |

**2022 දෙසැම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | | |
|---|---|---|---|
| I. | නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු.3,000.00 |
| II. | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු.4,670.00 |
| II. | කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | -රු.4230.00 |
| III. | එම්. ඒ. වසන්ත මයා | -රියදුරු | -රු. 5,600.00 |

**22. අතිකාල දීමනා ගෙවීම්**

**2022 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 772.80 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු. 9,226.40** |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 9,136.66 |
| කේ. එච්.එම් නිශාන්ත ඉදුනිල් | - රියදුරු | **- රු. 8,596.60** |
| ඩී.ටී.ආර්.ඒ. තරිඳු ගුණරත්න මයා | - මුරකරු | **- රු. 5,203.64** |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | **- රු. 8,542.27** |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | **- රු. 4,445.81** |
| අයි.කේ.ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | **- රු. 4,181.70** |
| උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 5702.76 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1472.80 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - කම්කරු | -රු 7,765.62 |
| කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | **-රු. 7,426.53** |
| එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | **- රු. 6,330.11** |

| | | |
|---|---|---|
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | **- රු. 473.43** |
| යූ.ජී. ආසිරි අභය කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | **- රු. 7,982.25** |

<u>පොදු අරමුදල්</u>

**23. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

කොතේගොඩකන්ද මාර්ගයේ කමලාවති මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් යොදාගත් මේසන් හා කම්කරුවන් වෙනුවෙන් ගෙවීම - රු. 27,600.00

**24. එස්.ඩබ්.ඒ සංජීව දිල්රුක්, බෝවිටියමුල්ල**

කොතේගොඩකන්ද මාර්ගයේ කමලාවති මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මිලදී ගත් ගල් හා වැලි සඳහා ගෙවීම -රු. 24000.00

**25. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

කොතේගොඩකන්ද මාර්ගයේ කමලාවති මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් යොදාගත් අමුද්‍රව්‍ය වෙනුවෙන් ගෙවීම -රු. 26300.00

.......................................................................................................................................

<u>ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම්</u>

**01. දයානි පුද්ගලික සමාගම, මාපලගම, ගාල්ල**

මාපලගම මහජන ක්‍රීඩාංගණයේ හා ළමා උද්‍යානයේ තීන්ත ආලේප කිරීම හා ආයුර්වේද මධ්‍යස්ථානයේ ජලනළ පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා මිළදී ගත් භාණ්ඩ සඳහා අදාළ බිල්පත පියවීම

| | | |
|---|---|---|
| I. | බිල්පත් අංකය - 508 | - රු. 6,055.00 |
| II. | බිල්පත් අංකය - 512 | - රු. 1,125.00 |
| III. | බිල්පත් අංකය - 513 | - රු. 1,660.00 |
| IV. | බිල්පත් අංකය - 515 | - රු. 5,484.00 |
| V. | බිල්පත් අංකය - 517 | - රු. 420.00 |
| VI. | බිල්පත් අංකය - 522 | - රු.10,000.00 |
| VII. | බිල්පත් අංකය - 523 | - රු. 3,360.00 |

<u>අංක 1-25 දක්වා ඉදිරි ගෙවීම් සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට යෝජනා කරමි.</u>

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක 1 –25 දක්වා සියළු ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව සහ ආවරණ අනුමැතියට යටත්ව කරන ලද ගෙවීම් සභාව විසින් පිළිගත හැකි බවටත් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**11-8 යටතේ ඉදිරිපත් කරනලද යෝජනා**

07. 2021වර්ෂයේ ආරම්භ කර ඇති අර්ධ වශයෙන් නිම කල ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු කිරීම සඳහා සකස් කරන ලද පහත ඇස්තමේන්තු සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.

i. වලකුඹුර ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම - රු. 37,137,746.66
ii. තල්ගස්වල නගරය සඳහා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර 1 ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තුව රු. 26,902,000.00

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

08. හගරන්වල ප්‍රාදේශීය සභා පෙර පාසල 2022 වර්ෂයේ සිට ළමුන් නොමැතිවීම නිසා වැසී තිබුණි. යූ.ජී. අසන්තිකා මදූෂානි යන ගුරුතුමිය ජාතික පෙර පාසල් සංවර්ධන පදනම යටතේ ඩිප්ලෝමාව හදාරා ඇති අතර, අංක 1/12, බටහේන්ගොඩ, උක්ඕවිට, උඩුගම යන ලිපිනයේ පදිංචිව සිටී. ඇය විසින් හරන්වල ප්‍රාදේශීය සභා පෙර පාසල නැවත ආරම්භ කිරීමට මා වෙත ඉල්ලීම් කර ඇති අතර, 2023 වර්ෂයේ පෙර පාසල නැවත ආරම්භ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

09. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කේ.පී.ජී.මධුෂා හේමචන්ද්‍ර මහත්මිය පරිසර විෂය භාර නිලධාරී ලෙස ක්ෂේත්‍ර නිලධාරී තනතුරේ වැඩ භාර ගන්නා ලදී. ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03-2019 චක්‍රලේඛය අනුව සංවර්ධන නිලධාරීන් සඳහා සංශෝධිත මාසික පරිවර්ථීත දීමනාව මාසිකව ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. 214 ඒ මලාමුර ග්‍රාම නිලධාරී වසමට අයත් සෞඛ්‍ය කාර්යාලය අසළ සිංහගිරිය මාර්ගය සංවර්ධනය කිරීම - රු. 90,000.00
02. පුහුල්හේන අම්බලන්ගොඩහේන මාර්ගය සංවර්ධනය කිරීම - රු. 50,000.00
03. අකුලහේන සදසිරි මහතාගේ නිවස දෙසට යන මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 20,000.00
04. අකුලහේන ධර්මදූත මධ්‍යස්ථානය පිහිටි මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 75,000.00
05. අකුලහේන උපුල් මහතාගේ නිවස දෙසට යන මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 30,000.00
06. ඌරල ගල්කන්ද පොදු නාන ළිඳ ඉදිකිරීම - රු.750,000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ) 4. මිළ ගණන් ඉදිරිපත් කිරීම

**නැත**

**(ඊ) කාරක සභා වාර්තා**

2022.12.30.වන දින පවත්වනු ලබන මුදල් කමිටු රැස්වීම සඳහා ඉදිරිපතිකරනු ලබූ ගෙවීම් වාර්තාව

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

01. 2022 දෙසැම්බර් මස ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභාගත කරන ලදී.

පෙ.ව 10.20 පමණ පියල් හිරිමුතුගොඩ මහතා, නිශාන්ත නන්දන මහතා, චන්ද්‍ර සහබන්දු මහතා, අමර ධනංජය විලේගේ මහතා, ධර්මසිරි ගනේවත්ත මහතා, විජිත් සහබන්දු මහතා ,බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා, වෙරංග ලක්මාල් මහතා, වසන්ත කුමාරගේ මහතා, ගයන්ති කුමාරි මහත්මිය සභාගර්භයට පැමිණෙන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

තල්ගස්වල පොළත්, උඩුගම පොළත් කවද පත්තරේද ඇඩ් එක දැම්මෙ. ප්‍රදර්ශනය කිරීමක් සිද්ධ වෙලා නැහැ. ටෙන්ඩරයක් ටෙන්ඩර් කරලා, විවෘත කරන කොට, ටෙන්ඩර් මණ්ඩලයක් තියනවා. මම ලේකම්තුමියගෙන් ඇහුවා. මේක විවෘත කරන්නේ 23 වනදා කිව්වා. නමුත් ඒ ටෙන්ඩරය 22 දින විවෘත කළා. 22 විවෘත කරන කොට ටෙන්ඩර් මණ්ඩලයක් තියෙනවා. සභාපතිතුමාවත්, කිසිදු නිලධාරියෙක්වත් මට දැනුම් දීමක් කළේ නැහැ. කතා කරලා කියනවා, ටෙන්ඩරේ කිසිදු ඉල්ලුම්පත්‍රයක් ලැබී නොමැති බැවින් අපි ටෙන්ඩර් මණ්ඩලය කැදෙව්වේ නැහැ. දැන් 22 දින විවෘත කරන දවසේ තමයි කියන්නේ, මේක පුරුදු වෙන්න නෙවෙයි කරන්නේ, ඔබතුමාට ඒක මතක් කරන්න ගත්තෙ, මම ඇහුවා අද දවස කීයද කියලා. දැන් අද තමයි බැලුවේ පෙට්ටියෙ ටෙන්ඩර් නැහැ. මම ඇහුව එවිට එතකොට ඔයා කොහොමද දන්නෙ කියල. අපි ඊයෙ වෙනකම් දින දීලා තිබුනා කියල එකක්වත් ටෙන්ඩර් ලැබිල නැහැ කියල, අකුරක් නැර මේවා වාර්තා කරන්න මගේ තර්කය, ක්‍රමය වැරදියි. 21 දවල් 12.00 ට ටෙන්ඩර් කරද්දි 5 දෙනෙක් ඇවිල්ලා කවුරුහරි දානවා. 22 විවෘත කරනවා. මේ අඩි පාරේ ගියොත් ආයෙත් මේ වලම තමයි කපාගන්නේ. 22 මට කතා කරනවා 10- 12ට විතර. ඔබතුමාට කතා කළේ නැහැ. ලියුමක් එව්වෙත්නැහැ, ටෙන්ඩර් නැති හින්දා කියල. මම අහනවා 21 වෙනිදා දවල් 12.00 ට මේකට කවුරුහරි ටෙන්ඩර් තුනක් ඉදිරිපත් කරනවා. 22 විවෘත කරනවා, නීත්‍යානුකූලව කරන්න. එතකොට ටෙන්ඩර් මණ්ඩලය කොහොමද මෙතනට කැඳවන්නේ. ටෙලිෆෝන් එකෙන් අපිට කියනවා හෙට 12ට ටෙන්ඩර් පෙට්ටිය කඩනවා කියලා. ඒ ගන්න කොටත් මම හිටියේ ගාල්ලේ. එතකොට අපි පුවත්පත්වල දැන්වීම් දාලා, මිනිස්සුන්ට එන්න කියනවා. නමුත් මෙතැනට ඇවිල්ලා ඉන්නකොට, ටෙන්ඩර් මණ්ඩලයේ කිසිම කෙනෙක් නැහැ. මම දන්නෑ ඔබතුමාගේ නොසැලකිල්ලද, නොදැනුවත්භාවයද කියලා. එතකොට නීත්‍යානුකූලභාවය නැති වෙනවා. අන්න ඒ විදියට ටෙන්ඩරය විවෘත කරලා තියෙන්නේ. එතකොට මම හොඳටම දන්නවා එහෙමනම් මේක පුවත්පතේ දැම්මා. ඒක කියෙව්වෙ නැහැ. ඊළඟට මම වටපිට හොයල බැලුවා. මේක පොළේවත් ගහලා තියෙනවද කියලා. කොහෙවත් නැහැ. ඊට පස්සේ කිහිප දෙනෙක් මගෙන් කතා කරලා ඇහුවා. මම කිව්ව 23 කැන්සල් වුනා. 22 විවෘත කරනවා කියලා. ඒ දිනයෙදි නැති වුනොත් අහල කියන්නම් කියලා. උඩුගමත් වුනේ ඒක. ඊට පසුව කමිටුව රැස් වෙලා ඒක කල් තිබ්බා. තියලා ටෙන්ඩරය යම් පුද්ගලයෙක් ලබාගෙන තිබෙනව. නමුත් නිත්‍යානුකූල නොවන සිද්දියක් එතැන වෙලා තියෙනවා. මන් දන්නෑ මේකෙ සත්‍ය අසත්‍යතාවය.

අසත්‍යනම් නිදහස් කරගන්න. ටෙන්ඩර් පටිපාටියක් තියෙනවා. මෙම ආයතනය තුළ එක්කෝ එම පවුල් වලට අයත් කිසිම කෙනෙකුට ඉල්ලුම් කළ නොහැක. සමස්ත පනත කියවලා බලන්න.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ටෙන්ඩර් බෝඩ් එකේ වාඩි වෙන්න බැරි එක විතරයි. විපක්ෂ නායකතුමා

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ටෙන්ඩර් බෝඩ් එකේ වාඩි වෙන්න තියා, ටෙන්ඩර් දාන්නත් බැහැ. අපි ඒක තර්ක කරන්නේ නැතිව ඉමු

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

මගේ තර්කය හරිද වැරදිද දන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ඔව් මමත් හරිද වැරදිද දන්නැති නිසා, ඒ සම්බන්ධව තර්ක කරන්න යන්නෙත් නැහැ. ඊට පස්සේ කවුරු හරි නිලධාරියෙක්, ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් දාන්න එනකොට, ටෙන්ඩර් එක විවෘත කරනවා. මට ඕකෙ අත්සන් කරන්න තියෙනවා කියලා මම දන්නේ නැහැ, මෙම නිලධාරියා කවුද කියලා, ඒ ටෙන්ඩරය මෙතන විවෘත කරනවා. ටෙන්ඩර් පෙට්ටියට දාන්න ඉස්සෙල්ලා, එයාට ටෙන්ඩරය ගියෙ නැහැ. ඒ ගිය නොගිය නිසා තමයි කතා කරලා, මේ පැමිණිල්ල ආවෙ. මේක විවෘත කරනකොට එක නිලධාරියෙක් හෝ නිලධාරිනියක් ඕකේ අත්සනක් ගහන්න තියෙනවා. ඕක එහෙනම් විවෘත කරලා දෙන්න කියලා කියනවා. අර මනුස්සයා මොනවත් දන්නේ නැහැ. මෙතැන ඉස්සරහ විවෘත කරනවා. විවෘත කරලා දුන්නට පස්සෙ මෙතන අත්සනක් දානවා. එහෙම නම් ටෙන්ඩරය දෙනකොට, ඉල්ලුම්පත්‍රයක් දෙනකොට මම හිතන්නේ ඔය සීල් එක ගහලා, ඔය ටෙන්ඩරය කඩනකොට අත්සනක් ගහන්න දෙන්න ඕන. සාමාන්‍යයෙන් ටෙන්ඩරය නිකුත් කර රුපියල් පන්සීයක් තැන්පත් කළ පසු ආපසු ගෙවන නොගෙවන දෙකම තියෙනවා. ගෙවීම් කලාට පස්සේ ඉන්පසු ඊට රුපියල් දෙදහසක් වැඩියෙන් ඔබතුමාට මේ පැමිණිල්ලෙ කොටසක් ඇවිල්ලා තිබුණා. ඥාති ප්‍රශ්නයක් තිබුන කිව්වා. එතකොට ඒ ටෙන්ඩර් මණ්ඩලයට අපි නෑ, ඒකට මම නෑ මම මළගෙදර හිටියෙ. මෙතුමත් මට හම්බවුනා. මෙතුමත් මට කිව්වේ නැහැ. ලේකම්තුමියට මම විනාඩි විස්සකට කලින් කතා කළා. ඒ කිව්වෙත් නැහැ. ස.තො.සෙ. කුණු මාස දෙකකින් ගෙනියන්න ඇවිල්ලා නෑ. මේකට එවන්න අහනකොට කියනවා, සතියෙන් සතිය කුණු ගන්න ඒ පැත්තට යනවා කියලා. මාස දෙකකින් කුණු ගෙනැල්ලා නැහැ. බලන්න කියලා මම ලේකම්තුමියට කතා කළා. ලේකම්තුමිය උත්තර දුන්න හා ඇත්තද කියලා. ඊට පස්සෙ අජිත් මහත්මයත් මට මලගෙදරකදී හම්බ වුනා. ඊට පස්සේ තමයි මම දන්නේ. ඒ පුද්ගලයා කියනකොට එතුමා ටෙන්ඩර් මණ්ඩලයේ හිටිය කියලා. ඒක මට ප්‍රශ්නෙකුත් නෑ. නිවැරදිභාවයකින් කටයුතු කරන්න. නමුත් නීත්‍යානුකූල නෑ කියලා, අකුරක් නැර ලියන්න සභාව හෙට විසුරුවොත් අපි පිරිසුදුයි. මම පිරිසිදුයි කියලා කියනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

සාමාන්‍යයෙන් පොළෙන් වර්ෂයකදී ලක්ෂ නමයක් අපි එකතු කරනවා. ඒ නිසා ලක්ෂ නමයකටවත් ටෙන්ඩර් අවම ලංසුව දාන්න තීරණය කළේ. ලක්ෂ 12කට තිබ්ච්ච මහා සභා තීරණය කමිටුව මගින් ලක්ෂ නමය දක්වා අඩුකිරිමට හේතුව ඇයි කියන එක ගැන තමයි මම තව දුරටත් මේ ආකාරයෙන් පැහැදිලි කළේ. නමුත් මෙය කමිටු තීරණයක් බැවින් මහසභාවේ සම්මතයක් අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**

ලක්ෂ නමය එකතු කලාට එතනත් ප්‍රශ්නයක් තියෙනවා. අපේ පොල එකතු කරන්න යන නිලධාරීන්ටත් ගෙවීම් කරද්දි, ලක්ෂ හයක් වගේ තමයි සභාවට ආදායම එකතුවෙන්නෙ. දැන් තියෙන තත්වය අනුව ශුද්ධ ලාභය ලක්ෂ නමයට සාමාන්‍යයෙන් ටෙන්ඩරය යන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

දොළහකට නම්, අනිවාර්යෙන් නමයකට පුළුවන්. අපි දන්නවනේ එතන එකතුවෙන ගාන. මසකටදැන් අනිවාර්යෙන්ම 25000.00 ක් එකතු කරන්න පුළුවන්, පොළ ටෙන්ඩරය ගන්න අය ලයිට් බිල ගෙවන්න ඕනද? ඒ වගේම පිරිසිදු කිරීම් කටයුතුත් කරන්න ඕනද?

**ගරු සභාපතිතුමා**

ලයිට් බිල ගෙවන්න ඕන. ඔව් ඒවගේම පිරිසිදු කිරිම් ඒ පොළ කරන අය විසින්ම කළ යුතුයි. කැලි කසල අපට භාරදිය හැකියි.

**ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා**

ලක්ෂ නමයට පොළ ගිහිල්ලා, ශුද්ද පවිත්‍ර කරලා, කුණු ටිකත් අයින් කරලා දෙනවනම්, අපේ නිලධාරීන්ටත් ගෙවන්න එපැයි. ඊට හොඳයි ලක්ෂ නමයකට දීලා ලක්ෂ නමයම සභාවට ගත්තම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

මම ඒ අදහස ස්ථිර කරනු ලබනවා

**ගරු සභාපතිතුමා**

j.c.b. යන්ත්‍රය සම්බන්දයෙන්කතා කරනවනම් අවම මිළකට ඒ කටයුතු සිද්ධ වෙන්න පුළුවන්. අවම මිල ප්‍රසිද්ධ කරන්න එපා කිව්වා.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

මිනිස්සු දැන් පේපර් ඇඩ් බලනවද නම් මම දන්නේ නැහැ. නමුත් මේකත් අමු අමුවේම සුළු මුදලකට දීලා දාලා වැඩක් නැහැ. මේ පිළිබඳව දන්නා අය දැනුවත් කරන්න.

**ගරු සභාපතිතුමා**

මෙහි පිළිබඳව ඔබතුමාල කට්ටිය දැනුවත් කරන්න.

පේපර් ඇඩ් දැමීම නීත්‍යානුකූල ක්‍රමවේදය, නමුත් වැඩක් නැති බව ඇත්ත.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ටෙන්ඩර් කමිටුව සාමාජිකයන්ට දැනුම්දීම කළේ නැද්ද? ඒකනෙ මේ ප්‍රශ්නෙ තියෙන්නේ. මෙතුමා කියන විදිහට දැනුම් දීමේ අවිධිමත්භාවය පැහැදිලිවම තියෙනවා. ඒකත් මේ පොල හින්දා. මේක අවිධිමත්භාවයටවත් දීලා නැහැනෙ. ෆෝන් කෝල් එකකින් දුන්නට වරදක් නැහැ. අවිධිමත් විදිහට හරි මට දැනුම්දීම කලානේ. මෙතුමාට අවිධිමත් විදිහටවත් දැනුම් දීලා නැහැ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ඉතින් මේක වැරදියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

එතන ඒක ඔබතුමාලා කියනවද මුල් එක හරිය කියලා, මුල් එක හරියන්න පුලුවන්ද? අද දවල් 12 ටෙන්ඩර් එක ඕපන් කරනවා. ඊයේ දවල් 12 වෙනකම් ටෙන්ඩර් නිකුත් කරනවා. අද ඕපන් කරන වෙලාවට මේක දාන්නේ. ඊට පස්සෙන්ද ඇවිල්ල දාන්නෙ. ඒ කිසිම කෙනෙකුට ලිපියක් නැහැ. අහවල් දවසේ ටෙන්ඩර් මණ්ඩලය රැස් වෙනවා කියලා. නීතිය ඔක්කොම කියා දෙන්නම් මම. ටෙන්ඩර්කරුවන් කැඳවන්න ඕන, එදාට පෝලිමේ ඉඳලා අත්සන් කරවගන්න ඕන.ටෙන්ඩර් බොක්ස් එකට දාන්න පෙර මේ විකාර කරන්න සූදානම් වෙන්න එපා. මේ සභාවේ අහිංසක මිනිස්සු සභාපතිවරු වෙන්න පුළුවන්. ඔබතුමාලත් මේ වැඩේ කරන්න වෙනවා. අනාගතයක් තියෙන්නේ ඔබතුමාලට. මේ වැරැද්ද කලහම දිගටම මේවා යනවා. මෙතන ඉන්න නිලධාරියෙකුට මේක තේරෙන්නේ නැත්නම්, නිලධාරි මොන දෙයකටද? මෙතන ඉන්නෙ. මේ කටයුත්ත කරන්න බැහැ. ටෙන්ඩරය open කරන දවසේ, ඒ එක්කම යන්න ඕන ලියුම අසවල් දවසෙ විවෘත කරනවා කියලා. තීන්දුව කරන්න ඕන. මෙතන ඇවිල්ලා වාඩිවෙනවා, ටෙන්ඩර් පත්‍ර නැහැ. ඊළඟට අපි මොකද කරන්නෙ කියලා, ඊළඟට අපි සභාවට දැනුම් දෙනවා අන්න තීරණය, ඕනනම් හදිසිනම් විශේෂ සභාවක් කැඳවීමේ හැකියාවක් තියෙනවා. අපට ඒක ඉක්මනට ජනවාරි මාසේ ලබාදෙන්න. ඒ නිසා විශේෂ කැඳවීමක් කරනවා. මේක නිසා ටෙන්ඩර් මණ්ඩලය මේ තීන්දුව ගත්තා. නමුත් තනිකර අවලංගු කරලා, ටෙන්ඩර් මණ්ඩලය සාකච්ඡා කරලා තීන්දුව දැනුම් දෙන්න ඕන. නමුත් ඒ දේ සිද්ධ වුණෙත් නැහැ. මොන දෙයක් වත් වුනේ නැතුව, මෙතනට ඇවිල්ලා, සභාවේ වැඩත් අවසානයි. ටෙන්ඩරය මෙයාට ගියා, අපි ගෙදර හිටියා ඔක්කොමත් හරි කියලා ඉවර කලා. දැන් කතා කරලා වැඩක් නැහැ. කොටහක් ගිහිල්ලා ඉවරයි. අලියගෙ නැට්ට තියෙන්නේ. නීත්‍යානුකූල බව නැහැ කියන එක මම කියනවා. කොමසාරිස්තුමාටත් මට පැමිණිලි කරන්න පුළුවන් හරිද මෙන්න මෙවැනි සිද්ධියක් වුනේ කියල. කෝ මේ පිටපත? ටෙන්ඩර මණ්ඩලයට දැනුම් දීපු ලිපිය දැන් ෆයිල් එකට ගිහිල්ලා හරියන්නේ නැහැ. වාර්තා කරන්න ඕන හරියටම. එක නිසා මේකට දැන් පොළවල් දෙකම නීත්‍යානුකූල නොවන බවත්, මේ සභාවේ තමුන්නාන්සේලා මේ කතාව දන්නේ නැති නිසා අත උස්සන්නෙ. දැන් දැනගත්තනේ. ඕක තමයි මට මේ සභාවේ කතා කරන්න තියෙන්නේ.

අනිත් එක තමයි, ගිය සභාවේ වෙනත් කරුණු යටතේ කතා කළ ඒවා සම්බන්ධව අඩුපාඩු තියෙනවා. මම මොකටද ඒ ගැන කතා කරන්නෙ තවත් කාලය ගන්න. මේ වාර්තාවෙ තියෙනවා ඔය ආදාහනාගාරයේ ගෙවීම්වලදී මම විරුද්ධ වුණාද නැද්ද? තමුන්නාන්සේලා කියන්න, කවුරු එකඟ වුනත් මම විරුද්ධය කියලා කිව්වා. ඔය සම්බන්ධව නැවත මම විග්‍රහ කරන්නෙ නැහැ. ගොවි සංවිධානයට කියලා ගොවි සංවිධානය යටතේ ආදාහනාගාරයේ ඉතිරි වැඩ කරන්න හැකියාව නෑ කියලා එදා මම කිව්වා. මම එකම දේ නැවත විග්‍රහ කරන්න යන්නෙ නැහැ. ඒ නිසා ගස් යන්න බැරි මිනිහෙකුට පොල් කැඩුව කියලා අපි කුලී පොතේ ලියනවා. ඒ මිනිහා ගෙන්වලා උසාවියෙදි කියනවා පුලුවන්නම් ගහේ නැගලා පෙන්නන්න කියලා. එයා කියනවා මට ගස් යන්න බැහැ කියලා. අපි ආයතනයෙන් සල්ලි ගෙවලා තියෙනවා. මෙන්න පොල් ගස් සීයක පොල් කැඩුවා කියලා. මතක ඇති මාව නිදහස් කරන්න, ඔබතුමාලා එකතුවෙලා සල්ලි ගෙව්වට කමක් නැහැ කියලා.

**ගරු උප සභාපතිතුමා**

ගරු සභාවෙන් අවසරයි. මේ පිළිබඳව අපට හරි පැහැදිලි වීමක් නෑ .දන්න කෙනෙක්, හරි පැහැදිලිකිරීමක් කරලා ප්‍රශ්නය විසඳන්න.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

මෙන්න අහගන්න එහෙනම්, එහෙම නම් මෙතනට ටෙන්ඩර්පත්‍රය දාන්න ආවා. ඒ ආවට පස්සේ දැන් මම මේක ගම් ගාල අරගෙන ආවා අලවගෙන ආවා ටෙන්ඩරේ පෙට්ටියට මෙහෙම දාන්නෙ. එතකොට මෙතන

යම් නිලධාරියෙක් හෝ නිලධාරිනියක් ආ ඔයාගේ ටෙන්ඩර් එක, ඔය ටෙන්ඩර් එක පොඩ්ඩක් විවෘත කරන්න, මට අත්සන් කරන්න. ඊට පස්සේ පුද්ගලයා ටෙන්ඩර් එක ගැලෙව්වා. සීල් එක හරි මොන ඉලච්චක් හරි කලා. ආපහු ඇලෙව්වා. ඊට පස්සේ දැම්මා තව දෙකක් වැටුනා. ඒ පුද්ගලයා අවදානයෙන් හිටියේ නැහැ. පස්සෙ තමයි මිනිහට මතක් වුනේ. මගේ ටෙන්ඩර් එක විවෘත කලා නේද කියලා, එයා කියනවා මේක ගිය එකත් ප්‍රශ්නයක් නැහැ, ඇතුලෙ කෙනෙකුට ගිහිල්ලා තියෙන්නෙ. ටෙන්ඩරය ගියෙත් ඇතුලටමයි. එතකොට සැකය ඇති වෙනවා. ඔයාලා ඕන දෙයක් කරගන්න. හොරකමත් මම කියා දෙන්නම් ඔයාලට.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ඊළඟට තියෙන කාරණය තියෙන්නේ, දැන් මම කියන තර්කය ඒක නෙවෙයි. දැන් සුසන්ත මහත්මයා දැන් ඔබතුමාලම කියන්න සහබන්දු මහත්තයාගේ ඉස්සෙල්ලා කතාවෙදි ඔය සිද්ධිය කතා කළාද?

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

රෙකෝඩින් එක දාන්න.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

සහබන්දු මැතිතුමා කිව්වානම් කිසි ගැටලුවක් නැහැ. මට ප්‍රශ්නෙ වුනේ ටෙන්ඩර් විවෘත කරන එකයි. ඇතුලෙ තිබ්බ සිද්ධියයි දෙකක් නේ.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

මේක සම්පූර්ණ කැන්සල් කරල දාන්න

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

මෙහෙම වැඩ කරන කෙනෙකුගේ නෝනට තමයි ටෙන්ඩර් එක් ගියේ. හෙට විසිරෙව්වත් අපි ගාව අතේ තියෙන්න ඕන.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව මයිලකවත් මගේ ගැවීමක් නැහැ. ඇත්තටම එදා ඔය සිද්ධිය සම්බන්ධව අද මේ වෙනකන් අපි දන්නෙත් නැහැ. මේ සිදුවීම වුනාට පස්සේ මම එනවා ටෙන්ඩර් ගන්න. ටෙන්ඩර් එක දාන්න ආපු එක්කෙනත් හරි වැරදියි, හරි මෝඩයි. එතුමා විවෘත කරල දෙන්නේ ඇයි? දාපු එක්කෙනා මොකද ටෙන්ඩර් එක බලන්න දෙන්නේ. එයත් වැරදියිනේ. නමුත් මෙතන මොනයම් හෝ වරදක් වෙලා තියෙනවා. අපි සභාවේ සමස්ත ඒකමතික තීරණය අනුව ඒ ටෙන්ඩරය කැන්සල් කරලා.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

තේරුම්ගන්න ලක්ෂ හය ටෙන්ඩරයක් රුපියල් දෙදහක පරතරයක් තියලා දාන්න බැහැ. සාමාන්‍යයෙන් 25000ක, 30000ක පරතරයක් නම් වෙන්න පුළුවන්. දෙදාහක් කිව්වම හොඳටම තේරෙනවා බලලයි කියලා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

මේකට වහාම පරීක්ෂණයක් කරන්න කවුද කළේ කියන එක සම්බන්ධව.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

ගරු සභාපතිතුමනි, මම මේ ටෙන්ඩර් බෝඩ් එකේ ඉන්න කෙනෙක් හැටියට මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අපි ටෙන්ඩර් මණ්ඩල ගණනාවක ඉඳලා තියෙනවා. සභාපතිවරයෙක් හැටියට මීට වඩා ලොකු ටෙන්ඩර් ගිහිල්ලත් තියෙනවා. ගැටලුව තියෙන්නේ මෙතන, ඒ ගැන පැහැදිලි කරගන්න ඕන. මට දුරකතනයෙන් දැනුම් දීම කළා. මම ටෙන්ඩර් බෝර්ඩ් එකට ආවා. පැහැදිලිව ගරු සභාපතිතුමනි, අපේ සභාවෙ ගොඩක් කාරණා, ඉතාම පැහැදිලිව, නීතියටම මේ අවුරුදු ගාන ඇතුළතම ගියේ නැහැනේ. අපට හැම ටෙන්ඩර් බෝඩ් එකටම ආරාධනා කරන්නේ දුරකථනයෙන්. දුරකථනයෙන් කතා කරලා ආරාධනා කළා කියන්නකො, ඒකට මම ආවා. නමුත් සභබන්ධු මහත්මයට සාමාජිකයෙක් හැටියට ඒ දැනුම් දීම කරලා නැත්නම්, ඒක ඒකමතිකව පිළිගන්නවා. කවුරු කළත් වැරැද්ද. එතුමට දුරකථනයෙන් කථා කරලවත් නැහැ. නමුත් ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වෙලාවේ, විවෘත කරන තැන අක්‍රමිකතාවයක් සිද්ධ වුණේ නැහැ. සම්පූර්ණ වගකියන්න එපැයි. මමත් සම්පූර්ණ වගකීමක් දරන්න ඕනද? එක ටෙන්ඩර් පතක හය ලක්ෂ දෙදහක් හෝ තව ටෙන්ඩර් පත්‍රයක හය ලක්ෂ දහ අට දහසක් වුණා. එක ටෙන්ඩර් පත්‍රයක හය ලක්ෂ විසි දහසක්, මෙතුමා කියන විදිහට,

**ගරු සභාපතිතුමා**

සභාවේ ඒකමතික තීරණයක් අනුව ඒ ටෙන්ඩරය අහෝසි කරලා නැවත ටෙන්ඩර් කිරීම සිදු කරනු ලබනවා.

**ගරු මන්ත්‍රී  අජිත් එඩේර ආරච්චි මහතා**

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී මට දුරකථනයෙන් හරි දැන්නුවා. නමුත් සහබන්දු මහත්තයට එහෙමවත් දැන්නුවෙ නැත්නම් ඒක වැරදියි. විවෘත කරන වෙලාවේ විවෘත කරන තැන අක්‍රමිකතාවයක් සිද්ධ වුණේ නැහැ. ඊට පස්සේ ටෙන්ඩර් බෝඩ් එකේ තීරණයට අත්සන් කරලා මමත් ගියා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

මම ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයෙක්.  ටෙන්ඩර් විවෘත කරන දවසේ උදේ තමයි කතා කරලා මට දැනුම් දුන්නේ. මම එවිට කොළඹ සෙත්සිරිපායේ වැඩට ගිහිල්ලා හිටියේ. මට ටෙන්ඩර් විවෘත කරන එකට සහභාගි වෙන්න බැරි වුණා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා**

සමහරවිට ඔය නිලධාරියා තේරුමක් නැතුව තමයි කරන්න ඇත්තේ. ඇය හිතන්න නැතුව ඇති ලොකු ප්‍රශ්නයක් ඇති වෙයි කියලා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

එම්.එම්. මන්ත්‍රීතුමාටත් කියලා තියෙන්නේ එදා උදේ නමයට, ටෙන්ඩරය විවෘත කරනවා කියලා.

**ගරු සභාපතිතුමා**

ඇත්තටම දැන් පේනවා. මෙතැන යම් කටයුත්තක් සිදු වෙලා තියෙනවා කියලා. ඔබතුමාලා කියපු කාරණාව සම්බන්ධව මම දැනුවත් නැහැ. දැනුවත්වීම අනුව ඔය ටෙන්ඩරය සභාවේ වැඩ කරන සේවකයකුගේ භාර්යාව අරන් තියෙන්නේ. ඒකත් වැරදි වැඩක්.

**ගරු උප සභාපතිතුමා**

ටෙන්ඩර් තුන දාපු පුද්ගලයෝ කවුද කියලා මෙතනදී කියන්නකො

**ගරු මන්ත්‍රී සමන් නාපෙවිතාන මහතා**

සභාපතිතුමා ඕකට පරීක්ෂණයක් කරන්න ඕන අනිවාර්යෙන්.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

මම කතා කළා දැන් මේ සිද්ධියට සම්බන්ධව නිලධාරින් සමග. ඒ නිලධාරිනිය පැහැදිලි කරලා කියනවා. එම ටෙන්ඩරය ගත් පුද්ගලයා එම ඇප්ලිකේෂන් එක එම වෙලාවෙලු අරගෙන තියෙන්නේ. අරගෙන ඒ ෆෝම් එකේ ගෙවපු මුදල දාන්න එයාට කියලා තියෙන්නේ, ඒ කොලේ නවලා, එයා කියනවා ඒ පුද්ගලයට කතා කරල අහන්න පුළුවන්ලූ. එයා හොඳට දැක්කලු ටෙන්ඩර් පත නවලා අත්සන දාන්න දීලා තියෙන්නේ.

**ගරු මන්ත්රී චන්ද්‍ර සහබන්දු මහතා**

මෙයාට අයිතියක් නැහැ. එතනට ගිහිල්ලා ඒ නිලධාරීන්ගෙන් අහන්න. ඒකට සභාපති ඉන්නවනෙ.

21 ටෙන්ඩර් මණ්ඩලය අවලංගු කරලා, 22 වාඩිවෙලා දුරකථන ඇමතුමක් දුන්නට හරියනවද? නීත්‍යානුකූල ලියුමක් දෙන්න ඕන එනවනම්.

ආදායම් පරිපාලක කියන්නෙ සහතිකයක් නොලත් පුද්ගලයෙක්, වැරදි කිහිපයකට අහුවෙච්ච පුද්ගලයෙක්. පිළිගත හැකි නිලධාරියෙක් යවන්න. ආදායම් පරිපාලක කියන්නේ චෝදනා ගොන්නයි. වංචා වලට ඒ පුද්ගලයා යවලා මෙතන ගේම් ගහන්න දෙන්න එපා. මෙතන නිලධාරීන් ඕනතරම් ඉන්නවා මේ විෂය කරන්න අවංක නිලධාරීන් හිටපු කෙනා ගියා. එක කරන්න චෝදනා ගොන්නක් තිබෙන මිනිහා දාලා.

**ගරු සභාපතිතුමා**

අනික් අයට කිච්ච නම් එන්න එපැයි

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

කවුද තීරණය ගත්තෙ පොල සම්බන්ධව

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ඒ තීරණය හරිනේ

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

සනපූර්ණය හරි නම් ඒකෙ වැරැද්දක් නැහැ. විපක්ෂ නායකතුමා කිව්ව දේ හැඟෙනවා. නමුත් මම පිළිගන්නේ නැහැ. නමුත් පැහැදිලිවම වංචා සහගත භාවයක් පේනවා. මේක අහෝසි කරන්න. ඒ වගේම සභාවෙ කෙනෙකුට මේක අරන් දුන්න නම්, ඒ නිලධාරීන් වැරදියි. අපි ගියාට පස්සේ මේ තීරණය වෙනස් කරන්න එපා. සභාපතිතුමනි, බොහොම ගෞරවයෙන් කියන්නේ, මම දන්නෙ නැහැ. මේ ලේකම්තුමිය මේකට සම්බන්ධ නැතුව ඇති. ලක්රුවන් මන්ත්‍රීතුමා කියන විදියට අතපසුවීමකුත්, අපිත් වැරදීමකුත් වෙන්න ඇති. අපි ඒක පිළිගන්න ලෑස්ති නැහැ. මේ වෙලාවේ රුපියල් 2000 ක පරතරයක් නිසා කවුරුහරි කියනවා නම්, මේක කැන්සල් කරන්න බෑ කියලත් බොහොම ගෞරවයෙන් කියනවා. බයවෙන්න එපා ඒ දේවල් වලට කියල.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි මම හිතන්නේ අපි පහුවෙලා හරි මෙහෙම දෙයක් හැමෝම මන්ත්‍රීවරු දැන ගත්ත එක ලොකු දෙයක් කියලා. මම මුලින්ම කියනවා මෙහෙ වංචා හා දූෂණය

නැති කරන්න නම් ඇත්තටම ප්‍රාදේශීය සභාවේ ඉඳලම පටන් ගන්න ඕන. මම ඇත්තටම සතුටු වෙනවා අපේ මන්ත්‍රීවරු ගත්ත තීරණය සම්බන්ධව මම හිතන්නේ මේ නිලධාරීන්ගෙන් යම් වැරැද්දක් වුනා ද කියන එක තමයි ප්‍රශ්නේ තියෙන්නේ නමුත් ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාට යෝජනා කරනවා නීතිමය පැත්තෙන් පියවරක් ගන්න කියලා මතක් කරමින් ඊලගට මම මේ සභාවෙ කතා කළා තල්ගස්වල සතිපොළේ වැසිකිලියෙ දොරක් ගලවගෙන ගිහිල්ල කියල. ලිපි බාර දුන්න පසුව්පරම කිසිම දේකට ලැබුනේ නෑ ඒ වගේම තමයි ළඟම තිබෙන අපේ සභාවේ වහලදාපු ආයුර්වේදයෙ ගොඩනැගිල්ලෙ ඉදිරිපස ගේට්ටුව ගලවගෙන ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිල්ලක් දැම්මා මොනව වෙයිද දන්නෙ නැහැ. ගරු සභාපතිතුමා තමයි මෙතන ඉන්න නායකය ඔබතුමාගේ වගකීම ඒකයි. ඔබතුමා ඒක නැහැයි කියලා බැහැර වෙන්න බැහැ ඔබතුමාගේ වගකීම ,අපි මෙතන නිලධාරීන්ට කියනවට වඩා ඔබතුමාට තමයි ඇඟිල්ල දික් කරන්න වෙන්නේ ඒ ගැන හිතන විට කණගාටුයි. මේ පරිපාලනය නිසා ඔබතුමාට අපට ඒ චෝදනාවක් කරන්න වෙනවා. ඒ නිසා මේ මාස දෙකවත් හරියට කරන්න නැත්නම් ඔබතුමාලා මේක ඇත්තටම මේ කියන විදියට මීට පෙරත් පාරවල් හදන්න ගිහිල්ලා බොක්කු හදන්න ගිහිල්ලා දවල් කිව්වා අර බෝක්කුවක් හදල තියෙනවා කවුද මන් දන්නෑ quotation කරල හැදුවේ කියලා. සියලුම වාර්තාත් එක්ක දුන්නා ඔබතුමා තවම නැහැ කිසිම වාර්තාවක් ගිහිල්ලා බැලුවයි කියලා වත් කිව්වේ නෑ. අනෙක් එක තමයි ගරු සභාපතිතුමනි තල්ගස්වල පොලේ බදු එකතු කරන්න යනවිට මම අහන්නේ මේ සභාවෙ කෙනෙක් යන්නෙත් නෑ. කොහොමද ඒ ක්‍රමවේද කියලා මම දන්නෙත් නැහැ. මම ගරු සභාපතිතුමා ගෙන් අහන්නේ ඒ ගැන ඇත්තටම දැනගන්න ඕන සාමාන්‍යයෙන් නිලධාරීන්ට අයිතියක් තියෙනවනෙ මම සියලු දෙනාටම අවුරුදු හැත්තෑ හතේ ශාපය අවසන් කරල සැමදෙනාටම අපි සමග එකතු වෙන්න කියලා ඉල්ලමින්සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. සුභ අනාගතයක්.

**ගරු මන්ත්‍රී එන්. වී.පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි, අපි මේ දැන් කතා කළ කතා වලින් ආදායම උත්පාදනය කරන්න කිසිදු යෝජනාවක් ගෙනාවේ නැහැ. පසුගිය දවස්වල ආන්ඩුකාරතුමා කිව්වා, වැලි කැණීම් වලින්, ගල් කැණීම් වලින්, ගල් බෝර දාන තැන්වලින්, ගල් වලවල්වලින් නිශ්චිත මුදලක් අයකර ගැනීම සඳහා අපේ සභාවේ යෝජනාවක් සම්මත කරලා තියෙනවා. නමුත් මේ වන තෙක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොන හේතුවක් නිසාද කියලා මම දන්නෙ නැහැ. මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිය වෙලාවේ, තාම ඒක ක්‍රියාත්මක නැහැල්ලු, ඇයි මේ අණ පනත් ගෙනැල්ලා ප්‍රමාද කරන්නේ. මේ කටයුතු කරන්න. සභාවට ලැබෙන්න තියෙන ආදායමෙන් යම්කිසි සේවයක් කරන්න පුළුවන්. ඒ නිසා මොකද්ද කරන්නේ කියලා ඔබතුමාල හිතන්න. අපි යෝජනා කලාට ඒවා ක්‍රියාත්මක වෙන්නෙ නැනේ. වැලි කැණීම් කටයුත්තක් කරනවා. මේ වන විටත් ගොවිජන මධ්‍යස්ථානයෙන්වත්, පරිසර එකෙන්වත් ව්‍යාපාරික මහත්තයෙක් ඇවිල්ලා, මැෂින් ගෙනත් දාලා, ලොකු ව්‍යාපාරයක් කරගෙන යනවා. දැන් වැලි සෝදන්නත් සූදානම් කරගෙන යනවා. අපේ සභාව දැනුවත් නැහැ. ග්‍රාම නිලධාරීත් දැනුවත් නැහැ. කිසිම නිලධාරීයෙක් දැනුවත් නැහැ. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නෙ අපට අදාලත් නැහැ. අපි එදා යෝජනා සම්මත කරගත්ත, යම් මුදලක් ලබා ගන්න. මොකද වුනේ? එය ක්‍රියාත්මක වෙනවාද නැද්ද? නැත්තම් ඒ සඳහා ගන්නා පියවර කුමක්ද කියලා ඔබතුමාගේ අහන්න කැමතියි. එහෙමනම්, ලැබුවා වූ 2023 නව වසර සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඉතාමත් කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්නම්. මම පසුගිය සභා වාරේ ලිඛිතව ඉල්ලීමක් කළා, උඩුගම පොළේ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක වෙද්දී කල එම වැඩේ නිවැරදි කර බිල ගෙවන්න කියලා. එහෙම නැතුව බිල නවත්තලා තියන්න

නෙමෙයි. ඒ අඩුපාඩුව නිවැරදි කරන්න කියලා මේ අවසන් අවස්ථාවේදී හරි ඉල්ලීමක් කරනවා. සුළු මුදලක් වැයවේවි. ඒ මුදලින් ඒ අවශ්‍යතාවය ඉටු කරලා, ඒක ගෙවන්නත් හැකියාව ලැබෙනවා. ඒ අඩුපාඩුව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන ගියොත්, දිනපතා මේ සියලු දේවල් වලින් පෙනී යන්නේ මාසෙකට සැරයක් ඇවිල්ලා තේ එකක් බීලා යනවා මන්ත්‍රීවරු සමග ඕනම දෙයක් කරන්න පුළුවන් කියල තමයි කටයුතු කරන්නෙ. සුළු සේවකයන්ගේ ඉහළම තමන්ට ඕන ආකාරයට රාජකාරිය තමන්ගේ අතට පත් කරගෙන ඒ නිලධාරීන්ගේ රාජකාරිය සුළු සේවකයන්ට අතට පත් කරගෙන සභාපතිවරයාගේ රාජකාරිය සේවකයන් අතට පත්කරගෙන මන්ත්‍රීවරුන්ගේ රාජකාරිය ඒගොල්ලො කරගෙන යනවා ඒගොල්ලන්ට ඕන ඕන විදියට මොකද මේ නිලධාරීන්ට ඕන විදියට තමයි කමිටු කැඳවන්නේ නියම ක්‍රමවේදයක් ඇතුව නොවෙයි කරගෙන යන්නෙ කමිටුව දාගමු කියලා මුදල් කමිටුවෙන් වෙන්න ඇති වෙනත් කමිටුවකින් වෙන්න ඇති ඒගොල්ලන්ට ඕන විදිහට සියලුම කටයුතු කරනවා විශේෂයෙන්ම සභාවෙ වැදගත්ම අංගය තමයි ටෙන්ඩර් එක සභාවේ ලොකුම ආදායම පොළවල් , පොළවල් ටෙන්ඩර් කරද්දී අක්‍රමිකතාවයක් සිදු වුණා කියන එක පිළිගන්න ඕන. ක්‍රමක්‍රයෙන් දැන් කතා කරගෙන යද්දි මුල ඉඳලම ප්ලෑන් කරපු වැඩක් කියලා. මම දන්නෑ කවුද කියලා සභාපතිතුමා නම් කියන්න මම දන්නේ නැහැ කියල. දන්නෑ කියන එක නෙමෙයි කාරණාව මේක තමයි සභාවේ උසස්ම තැන මේක තමයි මේකෙ තියෙන ප්‍රධාන රැස්වීම මේක දන්නේ නැහැයි කියලා කියනවා නම් ගැටළුවක් ඔබතුමා කියනවා නම් සද්භාවයෙන් යුක්තව දන්නැත්තම් දන්නවනේ මේ වෙච්ච දේ නිවැරදි තීරණ ගත යුතුයි .මේ සියලු දෙනාට සේවකයන්ට ඕන විදිහට කරගෙන යන්න ලෑස්ති කරන්න නරකයි. මොකද මේ මහජනතාවගේ වගකීම ඒ ආකාරයෙන්ම වෙනස් කරලා අපි කාටත් සතුටින් යන්න පුළුවන්. අපි මේ සැරේ ඡන්දය ඉල්ලයිද නැද්ද ප්‍රශ්නයක් නෙවෙයි. අපි ඒ කටයුත්ත අවසාන මොහොත දක්වා කරගෙන යමු.

තව කාරණයක් තමයි උඩුගම පොලේ සිද්ධිය, ඒ වැරැද්ද නිවැරදි කරලා, බිල් නවත්තන් ඉන්න නෙවෙයි, වැඩේ නිවැරදි කරලා, ඒ ගෙවීම් කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. ලේකම්තුමියට කතා කළහම කියන්නේ, ඒ නිලධාරී විසින් එතන වැරැද්දක් වෙලා නැහැ කියලා කියනවා කියලා. එහෙම නම් ඔවුන්ගේ වාර්තාව අපට ලබා දෙන්න. ඒ වැරැද්ද අපි පෙන්නුවා. ඒ වැරැද්ද නිවැරදි කියනවනම්, මම කැමතියි ඒ නිලධාරියාත් එක්ක එතනට ගිහිල්ලා ඒ වැරැද්ද පෙන්වා දෙන්න.
පහුගිය දවස්වල ආණ්ඩුකාරතුමා පැමිණි වෙලාවේ සභාපතිතුමා අතින් දූප්පත් සභාවක් කියලා කිහිපවිටක්ම කියවුනා. එහෙම කියද්දී, ආණ්ඩුකාරතුමාම කිව්වා ලක්ෂ හාර පන්සියයක් මේ සභාවට නිකුත් කලා කියලා. මම දන්නෑ හරියට ගණන. නමුත් උත්සව සභාවේ එහෙම කියලා තිබුණා. ඒ මුදල්වලින් මොනවද කලේ කියලා මම අහනවා. සල්ලිත් නෑ. ඒ නිසා අපි දූප්පත් කියලා නිකම්ම නිකම් පුස් සභාවක් ලෙස 2018 අපි පත්වෙලා, 2023 අපි විසිර යනවා. අපි යම් යම් උත්සාහයක් කලා විසඳගන්න. ඒවා අපේ ඒව නෙවෙයි. ආදාහනාගාරය, තල්ගස්වල වෙළඳ සංකීර්ණය, අපේ සභාවට ලක්ෂ හාර පන්සීයක් එතුමා දුන්නයි කියනවනම් අපට දැනෙන දෙයක් කළාද කියලා අහනවා. අපි ලයිට් ටික දැම්මා. හාර පන්දාහ ඩීසල් ගැහුවා. නැවතත් මොකක්ද කළේ කියලා අහනවා.ඉදිරියේදී ඔබතුමාලා නැතිව කවුරු පත්වුණත් මේ වගේ අපරාධයක් වෙන්න දෙන්න එපා කියලා මම කියනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මහජන ක්‍රීඩාංගණය ගැන මීට ඉහත අවස්ථා කිහිපයකදී කතා කළා. අපි නැති කාලේ ක්‍රීඩා පිටිය මැදින් වැටක් ගැහුවා. ඒක මොන සීමාවකටවත් අයිති නැති විදිහට, දුර මීටර් සීයක් හරි ඇතුලත් කරලා, ඒ සියල්ලට වගකියන්න ඕන ඒ කාලේ හිටපු නිලධාරීන්, ඒ සල්ලි තිබෙන කාලේ ඒ විසුරුවපු වකවානුවේ නිලධාරීන්ට ඕන විදිහට වැරදි වැඩ කරලා තියෙනවා. ප්‍රදේශයේ ක්‍රීඩාපිටිය භාවිතා කරන අයට එය ගැටලුවක් වෙලා තියෙනවා. ඒක නිවැරදි කරන්න කියල ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, ඒ වැට ගලවලා ඒක පාවිච්චි කරන්න පුළුවන් ආකාරයට, ඒ ක්‍රීඩාපිටිය පුළුල් කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේවා ලොකු වියදම් යන වැඩ නෙවෙයි. ඒ වගේම පොලේ මාළු වෙළෙන්දො ටික අපි කියලා, පොලේ පිටුපසට දැම්මා. එකේ හානිය තමයි වැසිකිළියේ දොර ඇරලා, එතන තමයි මාළු විකුනන්නෙ. ඒකෙ හරිම අවලස්සනක් තියෙන්නේ. ඒකෙ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුත් ඉන්නවා, අපිත් ගිහිල්ලා බඳු ගන්නවා. ඉතින් එහෙම තැනක වැඩක් කරන එක හොඳයි. නමුත් එම පොලේ වෙළෙන්දන් ස්ථානගත කිරීමේදී එය කරල තියෙනවා. ඒකට

නැවතත් ස්තූතියි. කරන දේ නිවැරැදි ආකාරයට කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඉදිරියේදී උඩුගම මහජන ක්‍රීඩාංගනයේ දී පැවැත්වෙන උත්සව සහ ක්‍රීඩා උත්සව, වෙනත් ප්‍රසංග වලට ගැලපෙන පරිදි, උඩුගම පොලේ සංවර්ධන කටයුත්තේ දී, ඒ සිදු වූ දෝෂයන් මග හරවලා, ඒ මුදල් ගෙවන්න තියෙන අයට ගෙවන්න. මොකද ඒ මුදල් නවත්තන් ඉන්න එපා. කාට හරි බිලක් නොගෙවන එක නෙවෙයි වැඩේ, නොගෙවා අරින්න වැරැද්ද මොකක්ද කියන එක හොයාගෙන යන්න ඕන.
ඊළඟට මෙම ටෙන්ඩර් කැඳවීමේ අවස්ථාවේදී සිදුවූ අක්‍රමිකතා සම්බන්ධව, අදාළ නිලධාරීන්ට දඬුවම් දෙන්න. එහෙම නැතුව ටෙන්ඩරය අහෝසි කරන එකවත්, නැවත ටෙන්ඩරය දාලා මුදල් වියදම් කරන කරලා නැවත කරන එකවත් නෙවෙයි වැඩේ. ඒ වැරැද්ද නැවත වෙන්න ඉඩ නොතබන්න කියලා ඉල්ලා සිටිමින්, ලැබුවාවූ 2023 වසර කාටත් ජයග්‍රාහී වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**
මූලාසනානුරූඪ ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මතු කරන්න යන්නේ අපේ තරංග මන්ත්‍රීතුමා මතුකරපු කාරණාවක් සම්බන්ධව. මමත් විවිධ අවස්ථාවලදී ක්‍රීඩා සමාජවලින් ඉල්ලීම් කලා. මම වගේම මගේ කොට්ඨාසෙ බාර මන්ත්‍රීවරයා වගේම මේ උඩුගම භාරව ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට පොදු කාරණයක්. අපි දන්නවා මාපලගම ඉන්න මන්ත්‍රීවරුන් ඔබතුමාලා ටික ඔබතුමාලගේ පැත්තට අරගෙන සංවර්ධනය කරලා අපි සතුටු වෙනවා. කමක් නැහැ. ඒක අපට විවාදයක් නැහැ. මෙච්චර කලක් අවුරුදු 5ක් තිස්සේ අපි ඉල්ලීම් කළත්, උඩුගම මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කර ගන්න ඇත්තටම මේ අවුරුදු පහ තුළ රුපියලක්වත් අපට හම්බ වුණේ නැහැ. ඒක කණගාටුවට කරුණක් ලෙසින් අපි දකින්නේ. එනිසා තරංග මන්ත්‍රීතුමා යෝජනා කල ඒ කාරණය පිළිබඳ නැවත වරක් මම කියන්න යන්නේ නැහැ. මොකද එතුමා ප්‍රකාශ කළා, ඒ සියලු කරුණු පසුගිය කාලේ සමාජය පැත්තෙන් අපි ක්‍රීඩාව ඔප් නංවන්නත්, වැඩිදියුණු කරන්නත් කිසිදු මාර්ගයක් ගත්තෙ නැහැ. ඉතින් ඒක නිසා ඔබතුමාව දැනුවත් කළා.
තරංග මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මම හිතනවා පරණ පොළත්, උඩුගම ක්‍රීඩාංගන භූමියත් අතර වැට ඒ ක්‍රීඩා සමාජය මගින් ඉල්ලීමක් කරනවා. ඉතාමත් ඉක්මනින් ඉවත්කර දෙන්න කියලා. ඉතින් ඒක නිසා මම මේ සභාවේ අවධානය යොමු කරන්න කියලා සභාපතිතුමා ප්‍රමඛ මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා. අපට ඇත්තටම එදා ඉඳලම දැන් පොල එහාපැත්තට ගිහිල්ලා තිබෙන අවස්ථාවේ ස්ථානීය පරීක්ෂාවක් සිදු කරලා ඉතාම ඉක්මනින් මේ අනවශ්‍ය වැට ඉවත් කරල හෝ නැත්නම් එහාට කරලා හෝ සීමාව නැවත ක්‍රීඩාංගනය පුහුණු ක්‍රීඩකයන් සඳහා සකස් කරල දෙන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**
ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මේ වෙලාවේ මම සිහිපත් කරනවා තල්ගස්වල බදාදා සතිපොල පිළිබඳව. මේ පොළ ටෙන්ඩර් පදනම මත හරි දීලා, නිසි ආදායම ලබාගන්න කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න. මොකද අපි දන්නේ නැහැ සභාව තව නොබෝ කලක් තිබේවිද, එසේත් නැත්නම් විෂය භාර අමාත්‍යවරයා විසුරුවාවිද කියලා. ඊට ඉස්සෙල්ලා තමුන්නාන්සේලට යුතුකමක් තියෙනවා. මම මීට ඉහතදීත් කිව්වා. මේ සභාව ඇතුලේ පරිපාලනමය ගැටළු රාශියක් තියෙනවා. මම දන්න විදිහට නම් යම් මට්ටමකට සභාවට නීත්‍යානුකූල කටයුතු කිරීමේ ක්‍රමවේදයක් තියෙනවා. ඒ වගේම මේ ප්‍රදේශයේ කුඹුරු ටික යම් මට්ටමකට ගත්තත් තව නොබෝ දිනකින් විනාශ වීමටත් පත්වීමට ඉඩ තියෙනවා. මේ පොහොර නිසා. මිනිස්සු අතේ සල්ලි තිබිලා නෙවෙයි පොහොර ටික ගත්තෙ. නමුත් මේ පොහොර නිසා මේ කුඹුරු ටික විනාශ මුඛයට පත් වෙලා තියෙනවා. පාර්ලිමේන්තුවේ ඉන්න කෘෂිකර්ම ඇමතිවරයාගේ ඉඳලා මෙම වගකීම බාරගන්න ඕන. අහිංසක මිනිස්සු නොමඟ යවලා.
ඊළඟ කාරණය සභාවෙ කැබ් රථය, පසුගිය දිනවල පරණ කැබ් රථය ගැන කතා වුණා. අද උදේ මට මෙතනට එන විට ලැජ්ජ හිතුණා. මේ පරණ කැබ් රථය තල්ලු කරල තමයි ස්ටාට් කරන්නෙ. මම දන්නෑ සභාපතිතුමනි, මේවා කරනවා නම්, මේ වාහන තාක්ෂණ නිලධාරීන් ලවා පරික්ෂා කරවලා, එක එක

අලුත්වැඩියා දවසින් දවස නොකර, එක දවසේ ඔක්කොම එකට කරවන්න. මේ වාහන වලින් ගසා කන මාෆියාවක් ගොඩනැගිලා තියෙනවා. මේ සභාවේ කියන්ඩත් ලැජ්ජයි. මේ සභාවෙ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල්, යම් යම් ආකාරයෙන්, යම් යම් පුද්ගලයන් සූරාකෑමේ ක්‍රමවේදයක් තියෙනවා. ලේකම්තුමියත් ඉන්න නිසා මම කියනවා, ඔබතුමිය රාජ්‍ය සේවිකාවක් ලෙස මේ සභාවේ කටයුතු කෙරෙන විදිහ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්න. මේ සභාවෙන් පිට ගම් මට්ටමෙන් ජනතාව යම් යම් අදහස් අපට ඉදිරිපත් කරනවා. මේ සභාවේ තොරතුරු යන්නේ. මේ සභාවේ අවිධිමත් පාලනය නිසා, සභාපතිවරයත් මේකෙ තියෙන පරිපාලනය පිළිබඳව,මෙහි වගකීම යම් මට්ටමකට බාර ගන්න ඕන.
මට දැනගන්න ලැබුණා සභාපතිතුමනි, එම්.එස්. අමරසිරි මහත්මයගෙ කාලෙ ඉඳලා මත්පැන් බාර් එකක් ගන්නත් මේ මිනිස්සු වලි කෑවා. මේ වන විට අපට ආරංචිය ලැබිලා තියෙනවා නාගොඩ ප්‍රදේශයේ බාර් එකක් දැමීමට සියලු කටයුතු සූදානම් කරලා කියලා. ඒ ගොඩනැගිල්ල නාගොඩ ප්‍රාදේශීය සභාවට අයිතියි. යම් බාර් එකක් දානවා නම්, නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඔබතුමාගේ අනුමැතියත් නාගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියත්, පොලීසියෙ අනුමැතියත් ලැබෙන්න ඕන. නමුත් මේ සියලු කටයුතු අවසන් වුනාට පස්සේ තමයි අපට ආරංචිය ලැබෙන්නෙ. මේවා කොහොම කෙරුණද? ඉහළ බලපෑමක් මත කෙරුනද? දැන් සමාජයේ දැඩි විරෝධතාවක් එනවා. විවිධ අය උත්සාහ දැරුවත් නාගොඩට ගන්න අපි ලැජ්ජ වෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙලා නාගොඩ ඒ වගේ කටයුත්තක් කිරීම පිළිබඳව.

මේ කොට්ඨාශ ක්‍රමයට ඡන්ද තැබීම මුදල් නාස්තියක් වෙනවා. ඉදිරියේ දී බාරගත්තත්, යම් මැතිවරණ ක්‍රමයේ වෙනසක් කරලා පිරිස අඩු කරල නරනවනම් හොඳයි.
අපේ පක්ෂයේ සමගි ජන බලවේගයේ නායකතුමන් මේ වන විට ජනතාවට සහන දෙන දැවැන්ත වැඩසටහන් කරගෙන යනවා. ලඟදි නාගොඩ රාජකීය විද්‍යාලයට එනවා. මේ වගේ දැවැන්ත වැඩසටහන් ජනතාවට සමගි ජන බල වේගයේ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වෙනවා. මම හිතනවා මේ වෙලාවේ 2023 අවුරුද්ද ලංකාවට ශුභ කාලයක් උදා වේවි, ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ වෙන කාලයක් උදාවේවි කියලා. මේ උදාවෙන කාලවකවානු තුළ වත්මන් ජනාධිපතිතුමත් සමඟ වැඩ කරන්න පුළුවන් ශක්තිමත් කණ්ඩායමක් තෝරා පත් වේවි. ඉදිරියේදී මේ රාජපක්ෂ පාලකයින් විසින් විනාශ කරපු රට ගොඩ ගන්න පුළුවන් වටපිටාවක් ඇති වේවි. ඒ වගේම මේ වෙලාවෙ දීර්ඝව කතා කරන්නේ නැහැ සභාපතිතුමා. මේ ලැබුවා වූ 2023 වර්ෂය ජනතාවට සුභම සුභ කාලයක් උදා වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

උප සභාපතිතුමා ඇතුළු සමස්ථ මන්ත්‍රීවරුනි, වනමල් මන්ත්‍රීතුමාගෙ කතාවෙන්ම මම පටන් ගන්නම්. ගරු මන්ත්‍රීවරුනි, මේ ගැන සාවධානව අසා සිටින්න. නාගොඩට බාර් එකක්. මේ පිළිබඳව මට පසුගිය දිනකදී නාගොඩ ජයසිංහාරාමය අසල පුද්ගලයෙක් කතා කරලා ඇහුවා. සභාපතිතුමා, නාගොඩට බාර් එකක් තියෙනවද කියලා. මම කිව්වා මම ඒ ගැන දැනුවත් නැහැ කියලා. මේ පිළිබඳව මම ඒ.ජී මහත්තයගෙන් ඇහුවා එතුමා කිව්වා ඔව් සභාපතිතුමා ඇත්ත නාගොඩට බාර් එකක් එනවා, මේක කොළඹ තිබුන බාර් එකක්, කොළඹ අවුරුදු පහක් විතර කරලා තියෙනවා. ඒ බාර් එකේ බලපත්‍රය අලුත් කරන්න යද්දි, ඒක තහනම් කරලා පසුව ඔවුන් අභියාචනාධිකරණයට ගිහිල්ලා තියෙනවා. ඒකෙ තීන්දුවක් දීලා තියෙනවා. අදාළ කොට්ඨාසයේ සුදුසු ස්ථානයක මේ බාර් එක දාන්න. මම මේ බාර් එකේ අයිතිකාරයා කවුද කියලා දන්නේ නැහැ. මේ බාර් එක අයිති පුද්ගලයා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබපු බිල්ඩිමක් සොයාගෙන යද්දී, නාගොඩ වලච්චේ හන්දියෙ තමයි එවැනි ස්ථානයක් සොයාගෙන තියෙන්නෙ. ඔවුන් අදාළ ස්ථානයට නුදුරු විහාරස්ථානයට ගොස් තිබෙනවා, මේ සම්බන්ධව විහාරාධිපති වහන්සේ දැනුවත් කිරීමට. ඔවුන් විහාරාධිපති වහන්සේ සමඟ පවසා තියෙනවා, මේ සඳහා සභාවේ අනුමැතිය ලැබී ඇති බව. ඔන්න මම අහු වෙච්ච තැන, ඒක හරි මේ සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වන ව්‍යාපාරික ගොඩනැගිල්ලේ සැළසුම සඳහා අනුමැතිය සභාවෙන් ලබාගෙන ඇති බව තමයි ඔවුන් පවසා තිබෙන්නෙ. එය හාමුදුරුවන් විසින් වරදවා වටහාගෙන තමයි මගෙන් මේ පිළිබඳව ඇසුවෙ. වෙනත් කිසිවක් මම ඒ ගැන දන්නෙ නැහැ.

ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමාලා විසින් කරුණු දක්වන ලද සභාව සතු සතිපොළවල් දෙක සම්බන්ධව මම පහදන්නම්. මන්ත්‍රීවරුනි, මෙම තල්ගස්වල සතිපොල සහ උඩුගම සතිපොල 2023 වර්ෂයට තල්ගස්වල පොළ ලක්ෂ 12 කටත්, උඩුගම පොළ ලක්ෂ 6කටත් ටෙන්ඩර් කිරිමට යෝජනා කළේ සභාවේ ඒකමතික තීරණයකින්. මීට පෙර වර්ෂයේ (2022) බදාදා පොළ ටෙන්ඩරය ලක්ෂ 23කට ආසන්න මුදලකට සහ සදුදා පොල ලක්ෂ 8 කට ආසන්න මුදලකට ලබා දුන්නත්, එය රටේ පැවැති අස්ථාවර වාතාවරනය තුල ටෙන්ඩර්කරු සාධාරණ කරුණු ඉදිරිපත් කිරීම තුළ නැවත සභාව මගින් පොළේ මුදල් එකතු කිරීමකට යොමු වුණා.

පසුව 2023 වර්ෂයට සභා තීරණය මත පොළවල් ටෙන්ඩර් කලමුත් කිසිම ටෙන්ඩරකරුවකු ඉදිරිපත් නොවීම තුළ, 2022.12.29 දින සභාවේ ටෙන්ඩර් කමිටුව (අජිත් එඩේරආරච්චි මහතා, ලක්රුවන් සම්පත් මහතා, එම්.එම්.දිසානායක මහතා) කැඳවා මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීරණය වූයේ, තල්ගස්වල බදාදා පොළෙහි ලංසුව වන ලක්ෂ 12 ලක්ෂ 9 දක්වා අඩු කිරීමටත්, උඩුගම පොල ලන්සුව ලක්ෂ 6 එලෙසම නැවත ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කොට ටෙන්ඩර් කිරීමටත්ය. එදින කමිටුව විසින් තල්ගස්වල පොළෙහි ටෙන්ඩරය අවම ලංසුව ලක්ෂ 12 තීරණය කළේ මහ සභාව විසින් වුවත්, එම ලන්සුව අඩු කිරීමේ තීරණය සභා අනුමැතියකින් තීරණය කිරීමටත්, උඩුගම සදුදා පොළෙහි ලංසුව වෙනසක් නොවූ නිසා එය එලෙසම ටෙන්ඩර් කිරීමටත්ය. ඒ අනුව 2023.01.05 වන දින උඩුගම පොල පමණක් ටෙන්ඩර් කල මුත් ඉදිරිපත් වූයේ ටෙන්ඩර්කරුවන් 03 දෙනෙක් පමණි. ඒ අනුව ඉදිරිපත් වූ වැඩිම ලංසුව වන හය ලක්ෂ විසි දහසක මුදල කේ.එච්.එම්. ඉනෝකා දමයන්ති මිය, මොරගල්මුල්ල, උඩුගම යන අයට ලබාදීමට එදින ටෙන්ඩර් කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව ඇය විසින් අදාල රැඳවුම් මුදල් සභාව වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව,පොළ මුදල් එකතු කර ගැනීම ඇයට භාර දුනි. නමුත් අද දින චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමේ දී ප්‍රකාශ වූ කරුණු සැලකිල්ලට ගෙන එහිදී යම් නීති විරෝධී ක්‍රියාවක් සිදුවී ඇත්නම්, පොළ බදුකරුගේ ටෙන්ඩරය අවලංගු කිරීමටත්, නැවත අලුතින් ටෙන්ඩර් කිරීමටත් කටයුතු කරන බව ප්‍රකාශ කරනවා. අවසාන වශයෙන් අද දින සභාවට පැමිණි සියළුම සභිකයන්ගේ අදහස් ඉෂ්ඨ කරගන්න වාසනාව, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:-